# මීගමුව අධ්‍යාපනය කලාපය
## දෙවන වාර ඇගයීම - 2025
## භූගෝල විද්‍යාව

**විභාග අංකය / නම** .....................................................................................................................

| **7 ශ්‍රේණිය** | | **කාලය පැය 02** |
|---|---|---|

### I කොටස

★ **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

★ **අංක 01 සිට 05 දක්වා ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුරු තෝරා යටින් ඉරක් අඳින්න.**

(1) පෘථිවි ගෝලයේ මතුපිට වර්ග ප්‍රමාණය වර්ග කිලෝමීටර් මිලියන ....................... ක් පමණ වේ.

(i) 516 (ii) 560

(iii) 510 (iv) 521

(2) දේශාංශ $180^0$ රේඛාව හඳුන්වන්නේ,

(i) ආක්ටික් වෘත්තය (ii) ජාත්‍යන්තර දින රේඛාව

(iii) ග්‍රිනිච් රේඛාව (iv) කර්කටක නිවර්තනය

(3) ‘වැව’ ලක්ෂණය කවර කලාපයක භූ ලක්ෂණයට අයත් ද?,

(i) වෙරළබඩ කලාපය (ii) වියළි කලාපය

(iii) තෙත් කලාපය (iv) කඳුකර කලාපය

(4) ශ්‍රී ලංකාවේ යාපනය අර්ධද්වීපය තුළ බහුල වශයෙන් යොදා ගනු ලබන ජල සම්පාදන ක්‍රමයක් වන්නේ,

(i) වර්ෂා ජලය (ii) ගංගා ජලය

(iii) වාරි තාක්ෂණය (iv) ආඩියා ලිං ජලය

(5) දකුණු ආසියානු කලාපයේ පහළම සාක්ෂරතාවය ඇති රට,

(i) ශ්‍රී ලංකාව යි. (ii) පාකිස්ථානය යි.

(iii) ඉන්දියාව යි. (iv) මාලදිවයින යි.

❖ **ප්‍රශ්න අංක 06 සිට 10 තෙක් දී ඇති වගන්තිය හරි නම් (✓) ලකුණ ද වැරදි නම් (✗) ලකුණ ද ප්‍රශ්නය ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.**

(6) කෝණේෂ්වරම් කෝවිල පිහිටා ඇතිතේ යාපනය දිස්ත්‍රික්කයේ ය. (    )

(7) ශ්‍රී ලංකාව සෞම්‍ය කලාපීය දේශගුණයට අයත් රටක් නොවේ. (    )

(8) බ්‍රිතාන්‍යය උතුරු අර්ධගෝලයේ පිහිටි රටකි. (    )

(9) මහාද්වීපයක් වූ ඕස්ට්‍රේලියාව තනි රටකි. (    )

(10) පේදුරුතුඩුවේ සිට දෙවින්ද්‍රරතුඩුව දක්වා දිග 422km වේ. (    )

❖ **ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා වරහන තුළ ඇති වචන උපයෝගී කරගෙන සුදුසු පිළිතුරු තෝරා ලියන්න.**
(අක්ෂාංශ $0^0$ , පෝක් සමුද්‍ර සන්ධිය , දේශාංශ $0^0$ , කයිට්ස් , එරල් )

(11) බ්‍රිතාන්‍යයේ ග්‍රිනිච් නගරය හරහා ඇඳ ඇති .......................................... රේඛාව ග්‍රිනිච් රේඛාවයි.

(12) උතුරු අර්ධ ගෝලය හා දකුණු අර්ධ ගෝලය වෙන් වන රේඛාව .............................. හෙවත් නිරක්ෂය වේ.

(13) ශ්‍රී ලංකාව ඉන්දියාවෙන් වෙන් වන්නේ ඉතා පටු මුහුදු තීරයක්වන ........................................ මඟිනි.

(14) .......................................... මුහුද ආසියා මහාද්වීපය තුළ පිහිටා ඇත.

(15) යාපන අර්ධද්වීපය ආශ්‍රිතව පිහිටා ඇති දූපතක් ලෙස .......................................... දැක්විය හැකිය.

❖ **ප්‍රශ්න අංක 16 දිට 20 තෙක් පහත දක්වා ඇති 'අ' තීරුව සඳහා 'ආ' තීරුව නිවැරදිව යා කරන්න.**

| | අ | ආ |
|---|---|---|
| (16) | ග්‍රීන්ලන්තය | මුහුදකි |
| (17) | කවුඩුල්ල | දූපතකි |
| (18) | බෝල්ටික් | දියඇල්ල |
| (19) | ඇබර්ඩීන් | සානුවකි |
| (20) | මහවලතැන්න | ජාතික වනෝද්‍යානය |

(ලකුණු 02 × 20 = 40)

## II - කොටස

- ❖ **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- ❖ **තවත් ප්‍රශ්න 04කට පිළිතුරු සපයන්න.**
- ❖ **පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව 05 කි.**

(1) (අ) පහත දැක්වෙන ලෝක සිතියම ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




(i) A අක්ෂරයෙන් දැක්වෙන ලොව විශාලතම දූපත නම් කරන්න.

(ii) B අක්ෂරයෙන් දැක්වෙන රට කුමක් ද?

(iii) C අක්ෂරයෙන් දැක්වෙන රට කුමක් ද?

(iv) දකුණු ඇමරිකා මහාද්වීපයට අයත් රටක් D අක්ෂරයෙන් දැක්වේ එය කුමක් ද?

(v) උතුරු ඇමරිකානු මහද්වීපයට අයත් රටක් E අක්ෂරයෙන් දැක්වේ. එය කුමක් ද?

(vi) අර්ධ වශයෙන් ගොඩබිම්වලින් වට වූ මුහුදක් F අක්ෂරයෙන් දක්වා ඇත. එය කුමක් ද?

(vii) G අකෂරයෙන් දැක්වෙන රේඛාව කුමක් ද?

(viii) H අකෂරයෙන් දක්වා ඇති සාගරය කුමක් ද? (ලකුණු 1 x 8 = 08)




(ආ) පහත දැක්වෙන ශ්‍රී ලංකා සිතියම ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) A අකෂරයෙන් දැක්වෙන්නේ ස්වභාවික වරායක් සහිත ප්‍රදේශයකි. එය කුමක් ද?

(ii) B අකෂරයෙන් දැක්වෙන දූපත නම් කරන්න.

(iii) C අකෂරයෙන් දැක්වෙන ජාතික වනෝද්‍යානය කුමක් ද?

(iv) පෞරාණික වැදගත්කමක් ඇති දිස්ත්‍රික්කයක් D අකෂරයෙන් දක්වා ඇත. එය නම් කරන්න.

(v) E අකෂරයෙන් දක්වා ඇති ගංගාව කුමක් ද?

(vi) F අකෂරයෙන් දක්වා ඇති දිස්ත්‍රික්කය කුමක් ද?

(vii) නිරිතදිග මෝසම දැක්වෙන අකෂරය කුමක් ද?

(viii) I අකෂරයෙන් දැක්වෙන නගරය කුමක් ද? (ලකුණු 1x8=08)

(2)




(i) ඉහත දැක්වෙන පෘථිවි ආදර්ශ ගෝලයේ A, B, C, ලෙස ලේබල යොදා ඇති මනඃකල්පිත අක්ෂාංශ රේඛා නම් කරන්න. (ලකුණු 03)

(ii) පෘථිවි භ්‍රමණය හා පරිභ්‍රමණය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(iii) පෘථිවිය ගෝලාකාර වස්තුවක් බව සැලකුව ද එය පූර්ණ ගෝලයක් නොවන බවට සාක්ෂි ඉදිරිපත් වී ඇත. එවන් සාක්ෂි දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

(3) (i) මහාද්වීපයක් යන්න හඳුන්වන්න. (ලකුණු 02)

(ii) ලොව විශාලතම මහාද්වීපය හා කුඩාම මහාද්වීපය ලියා දක්වන්න. (ලකුණු 02)

(iii) ශ්‍රී ලංකාව හැරුණු විට ලොව පිහිටා ඇති දූපත් 3ක් ලියා දක්වන්න. (ලකුණු 03)

(iv) සාගර යන්න හඳුන්වන්න. (ලකුණු 02)

(v) මහාද්වීප අභ්‍යන්තරයේ පිහිටි මුහුදු 02ක් ලියන්න. (ලකුණු 02)

(4) (i) රටක පිහිටීම දැක්විය හැකි ආකාර 02 දක්වන්න. (ලකුණු 02)

(ii) ශ්‍රී ලංකාවට දකුණින් ඇති සාගරය හා බටහිරින් ඇති මහාද්වීපය දක්වන්න. (ලකුණු 02)

(iii) අන්තර්ජාතික සාගර නීතියට අනුව ශ්‍රී ලංකාවට හිමි වී ඇති මුහුදු සීමා 2ක් එහි අගයන් සහිතව දක්වන්න. (ලකුණු 04)

(iv) ශ්‍රී ලංකාවේ ප්‍රධාන භූ විෂමතා කලාප 03 ඒවායේ උස සමග ලියා දක්වන්න. (ලකුණු 03)

(5) (i) පහත සඳහන් ආගමික උත්සව සමරනු ලබන ආගමික කණ්ඩායම් දක්වන්න.

A. හජ්ජි උත්සවය

B. මඩු මංගල්‍යය (ලකුණු 02)

(ii) ශ්‍රී ලංකාවේ සංස්කෘතික උරුමයන් වර්ග 2 කි. පහත දක්වා ඇති සංස්කෘතික උරුමයන් එම වර්ග දෙකට වෙන්කර දක්වන්න (ලකුණු 04)

a) සිරිත් විරිත්
b) දිය ඇලි
c) ආගන්තුක සත්කාර
d) නාමල් උයන

(iii) ආදිවාසී ජනයා ජීවත්වන ප්‍රදේශ 2 ක් ලියන්න. (ලකුණු 02)

(iv) ආදිවාසී ජනයාගේ ජීවනෝපාය 3 ක් ලියන්න. (ලකුණු 03)

(6)

(i) පහත සිතියමේ දක්වා ඇති දකුණු ආසියාතික රටවල් නම් කරන්න. (ලකුණු 07)



(ii) ශ්‍රී ලංකාවේ සමාජයීය සංවර්ධනය ඉහළ මට්ටමක පවතී. එයට බලපා ඇති සාධක 02ක් ලියන්න. (ලකුණු 02)

(iii) සාක්ෂරතාවය ඉහළ අගයක් ගන්නා දකුණු ආසියානු රටවල් 02ක් ලියන්න. (ලකුණු 02)

(7)

(i) කඳුකර භූ දර්ශනයේ කැපී පෙනෙන භෞතික ලක්ෂණ 03 ක් ලියන්න. (ලකුණු 03)

(ii) කඳුකර භූ දර්ශනයේ දැකිය හැකි මානව ක්‍රියාකාරකම් 02ක් ලියන්න. (ලකුණු 02)

(iii) වියළි කලාපීය භූ දර්ශනයේ දැකිය හැකි ශේෂ කඳු 02ක් ලියන්න. (ලකුණු 02)

(iv) තෙත් කලාපීය භූ දර්ශනයේ ඇති නිදහස් වෙළඳ කලාප 02 ක් ලියන්න. (ලකුණු 02)

(v) සංචාරකයන්ගේ ආකර්ෂණය හිමි වී ඇති දර්ශනීය වෙරළ තීර 02ක් ලියන්න. (ලකුණු 02)